




රසික සූරියආරච්චි

# ටීචර්, සර්, මහත්තයා

ඇතැම් සම්මත සේවාවල රැකියාවල නිරතවන්නන්ට නියමිත නිල ඇඳුම් ඇත. මෙය රජයේ සේවාවල මෙන්ම පුද්ගලික අංශයේ ද දැකිය හැකි දෙයකි. සේවා දායකයාට, සේවා සපයන්නා පහසුවෙන් හඳුනා ගැනීමට ඉඩ සැලසීම මෙමගින් අපේක්ෂිත එක් ප්‍රතිපලයක් විය යුතුය.

ලංකාවේ රජයේ සේවා රැකියාවන් ගැන සලකා බලද්දී පොලීසිය, ත්‍රිවිධ හමුදා වැනි රැකියාවල මෙන්ම මහජන සෞඛ්‍ය පරීක්ෂක සේවය, ආගමන විගමන සේවය, රේගු සේවය, හෙද සේවය වැනි රැකියාවන්හි යෙදෙන්නන්හට ද මෙසේ නිල ඇඳුම් ඇඳීමට නියම වී ඇත.

එසේ නමුදු ලංකාවේ අස්සක් මුල්ලක් නෑර පැතිර පවතින විශාලතම සේවාව වූ රජයේ ගුරු සේවයේ නියුතු අයට නම් නිල ඇඳුමක් නියමිතව නැති බව පෙනේ.

නිල ඇඳුමක් තිබීම නිසා සේවකයින්ට ලැබෙන වාසියක් නම් ඒ නිල ඇඳුම් මෙන්ම ඒවා නඩත්තු කිරීම සඳහා දීමනාවක් ද ලැබීමයි. එය සෑහෙන ආර්ථිකමය වාසියකි. නිල ඇඳුමක් නොමැති නම් තමන්ට කැමති වර්ණයක හෝ ආකාරයක ඇඳුමක් සේවය සඳහා ඇඳිය හැකි වෙතත් ඒ සඳහා යන වියදම තමන්ගේ වේතනයෙන් පියවා ගත යුතු බව අමුතුවෙන් කිව යුතු නොවේ.

ගුරු සේවය සඳහා නියමිත නිල ඇඳුමක් නැති යැයි මා ඉහත ලියූවේ එසේ නිල ඇඳුම් නිකුත් කිරීමක් හෝ පත්වීම් ලිපියේ නිල ඇඳුමක් තියා අඩු ගණනේ ඇඳිය යුතු ඇඳුමක් ගැන සඳහනක් හෝ නොමැති බව අසා සැක හැර දැනගෙන ඇති නිසාය.

නමුත් ප්‍රායෝගික සත්‍යය එය නොවේ!

විවිධ සමාජ, චාරිත්‍ර, සම්මත, රීති නිසා සහ ඒ මත පදනම්ව බොහෝවිට තමන්ම පණවා ගෙන ඇති වාරණ මත ගුරු සේවයටද නොනිල නිල ඇඳුමක් නියමිතව ඇත.

ගුරුවරියන් සඳහා මේ නිල ඇඳුම වන්නේ සාරිය හෝ ඔසරියයි. සේවයේ නිරත නොවන කාල වේලාවේ දී ගවුම්, සාය හැට්ට, කමිස කලිසම්, ලුංගි, සල්වාර් කමීස් හෝ වෙනත් මොන ඇඳුමක් ඇන්දා වුවද ගුරු සේවයේ යෙදෙන කාන්තාවෝ අනිවාර්‍යයෙන්ම එක්කෝ සාරිය හෝ නැතිනම් ඔසරිය සේවය සඳහා අඳිති.

මා කොලු කාලේ උගත් පාසලේ ඉංගිරිසි ගුරුවරියක් ලෙස සේවය කළ වෑන් ඩයික් නම් වූ බර්ගර් යුවතියට ද සාරිය ඇඳ සේවයට එන්නට සිදුවූයේ මේ නිසා ය. ඇය ගවුමකින් සැරසී සේවයට පැමිණියා නම් සමහර විට කිසිදු ප්‍රශ්ණයක් ඇති නොවන්නට ද ඉඩ තිබුණි. නමුත් කිසි දිනෙක එය සිදු නොවුණි!

පූජ්‍ය පක්ෂයට අයත් නොවන පිරිමි ගුරුවරුන් සේවය සඳහා පැමිණියේ එක්කෝ කලිසම සහ කමිසය ඇඳගෙනය. නැතිනම් ජාතික ඇඳුම ඇඳගෙනය.

බතික් හෝ පිජාමා හෝ පලේකාට් හෝ සරමක් ඇඳ සේවයට පැමි□මට කිසිවෙකු නොසිතූ බව පෙණුනි. ඒ ඇඳුම් තත්වයෙන් බාල වූ ඒවා වෙන්නට ඇත.

අතීතකාමයේ ගැලෙමින් මා මේ ලිපිය සඳහා කරුණු ගොණු කළේ එක් විශේෂ කරුණක් කියන්නටයි.

මා කුමර දිවිය ගත කරමින් උගත් කොස්සින්න කණිටු පාසලේ දී අප ගුරුවර ගුරුවරියන් ඇමතීම සඳහා ආමන්ත්‍රණ පද යොදා ගත්තේ ඔවුන් ඇඳ සිටි ඇඳුම අනුවය.

සාරිය හෝ ඔසරිය ඇඳ සිටි ගුරුවරියන් අප ඇමතුවේ ඉංගිරිසි බසින් "ටීචර්" යන පදයෙනි. හේමවතී ටීචර්, සීලවතී ටිචර්, බමුණුසිංහ ටීචර් යනාදී වශයෙනි.

ජාතික ඇඳුම ඇඳි පිරිමි ගුරුවරුන් මහත්තයා ලෙස හඳුන්වනු ලැබූහ. චන්ද්‍රසේන මහත්තයා, නිකුලස් මහත්තයා, ලොකු මහත්තයා යනාදී වශයෙනි.

කලිසම සහ කමිසය හැඳ සේවයට පැමිණි ඒකනායක ගුරුවරයා පමණක් "සර්" නමින් අපෙන් ඇමතුම ලද්දේය.

"සර්" යන පදය 1972 වසර අවසානයේ දී පහේ පන්තිය සමත්ව මා ඒ කණිටු විදුහලෙන් ඉවත්වන තුරුම කලිසම් අඳින ගුරුවරයෙකු සඳහා මිස ජාතික ඇඳුම අඳින ගුරුවරයෙකු සඳහා නොයෙදිණි. ■

# ඔබගේ ඉඩම්/නිවාස මිලදී ගැනීම් සඳහා වන නවතම මුද්දර ගාස්තු සංශෝධන

මධූ වර්ණකුලසූරිය එල්.එල්.බී.
**නීතිඥ (ශ්‍රී ලංකාව)**
**සොලිස්ටර් සහ බැරිස්ටර් (ඔස්ට්‍රේලියාව)**

ඔබ 2013 ජනවාරි 01 දිනට පසුව නිවාස/ඉඩම් මිලදී ගැනීමට අපේක්ෂාවෙන් පසුවන්නේද?

එසේ නම් මෙය ඔබට සතුටුදායක පුවතක් වනු ඇත. ඔබගේ දේපළ මිලදී ගැනීම් සඳහා වන රජයේ මුද්දර ගාස්තු 30% දක්වා ප්‍රමාණයකින් පහල දමා ඇත.

සුදුසුකම්ලාභී ප්‍රථම පදිංචි ස්ථානය මිලදී ගන්නන් සඳහා වන මුද්දර ගාස්තු අඩු කිරීම

සුදුසුකම් ලාභී ප්‍රථම පදිංචි ස්ථානය මිලදී ගන්නන් සඳහා වන මුද්දර ගාස්තු අඩු කිරීම කොපමණද?

2011 ජූලි 01 දින හෝ ඉන් පසුව ගිවිසුමට එළඹෙන, සෑම බදුවලට යටත්වියහැකි ගනුදෙනුවක් සඳහාම සිය මුල් පදිංචි ස්ථානය වශයෙන් ඩොලර් 600,000/- නොඉක්මවන දේපළක් මිලදී ගන්නා සුදුසුකම් ලත් මුල් පදිංචි ස්ථානය මිලදී ගන්නන් සඳහා වන ඉඩම් පැවරීමේ බද්ද ඉහත සඳහන් කළ ගාස්තු අඩු කිරීමට යටත් වේ.

මෙකී මුද්දර ගාස්තු අඩුකිරීම සඳහා සුදුසුකම් ලැබීමට නම් අදාළ පදිංචි ස්ථානය මිලදී ගන්නා තැනැත්තා එකී මුල් පදිංචි කරුවන් සඳහා වන දීමනාව (First Home Owner Grant) FHOG සඳහා සුදුසුකම් ලද්දකු විය යුතුම වන අතර ඔහු අදාළ දේපළෙහි ගිවිසුමට එළඹෙන දින සිට මාස 12ක කාල සීමාවක් තුල අඛණ්ඩ පදිංචිය සනාථ කල යුතු වේ.

මෙම 50% දක්වා වන මුද්දර ගාස්තු අඩු කිරීම අවුරුදු 4ක කාලයක් තුල අදියර කිහිපයකින් සිදුවන අතර, එය 2011 ජූලි 01 දිනට 20% ක අඩුවීමක්ද පිළිවෙලින් 2013 ජනවාරි 01, 2014 ජනවාරි 01 හා 2014 සැප්තැම්බර් 01 වශයෙන් තවත් 10 බැගින් වන අඩුවීම් වලින් ද සමන්විත වනු ඇත.
සුදුසුකම් ලාභී මුල් පදිංචි ස්ථානය මිලදී ගන්නන් තම මුල් පදිංචි ස්ථානය මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තු අත්සන් තැබීම 2011 ජූලි 01 දින හෝ ඊට පෙරාතුව සිදුකළේ වී නමුදු ගිවිසුමට (settlement) එළඹීම 2011 ජූලි 01 දින හෝ ඊට පසු දිනෙක සිදු වන්නේ නම් ඔවුන්ද ඉහත සඳහන් කළ මුද්දර ගාස්තු අඩු කිරීමේ වරප්‍රසාදය ලැබීමට සුදුස්සෝ වෙති.

## සුදුසුකම් ලැබීමට සැපිරිය යුතු සාධක

2011 ජූලි 01 දින හෝ ඉන්පසුව ගිවිසුමට එළඹෙන සෑම බදුවලට යටත් විය හැකි ගනුදෙනුවක් සඳහාම මුද්දර ගාස්තු අඩු කිරීමේ සහනයට හිමිකම් ලැබීමට සුදුස්සකු වීමට නම් ගැනුම්කරු;

- මිලදී ගන්නා ඉඩම/නිවස සඳහා මුල් පදිංචිකරුවන් සඳහා වන දීමනාව (First Home Owner Grant) ලබා සිටිය යුතු හෝ ඒ සඳහා සුදුසුකම් ලද්දකු හෝ විය යුතුය.
- අදාළ මුලික පදිංචි ස්ථානය වන දේපළෙහි අයිතිය ලැබූ දින සිට (සාමාන්‍යයෙන් ගිවිසුමට (settlement) එළඹෙන අවස්ථාව) ආරම්භ වන අවම වශයෙන් මාස 12ක අඛණ්ඩ පදිංචිය.

**මුල් නිවාස හිමිකරුවන්ට හිමිවන මුද්දර ගාස්තු ඉතිරිය**

| ඉඩමේ/නිවසේ වටිනාකම | වර්තමාන මුද්දර ගාස්තු (ප්‍රථම ලියා පදිංචි ස්ථානය) | 20% අඩු කිරීමෙන් පසු ගෙවිය යුතු මුද්දර ගාස්තුව | 20% අඩු කිරීමෙන් ලැබෙන ඉතිරිය | 50% අඩු කිරීමෙන් පසු ගෙවිය යුතු මුද්දර ගාස්තුව | 50% අඩු කිරීමෙන් ලැබෙන ඉතිරිය |
|---|---|---|---|---|---|
| $200,000 | $ 6,370 | $5,096 | $1,274 | $3,185 | $3,185 |
| $300,000 | $ 11,370 | $9,096 | $2,274 | $5,685 | $5,685 |
| $400,000 | $ 16,370 | $13,096 | $3,274 | $8,185 | $8,185 |
| $500,000 | $ 21,970 | $17,576 | $4,394 | $10,985 | $10,985 |
| $600,000 | $ 28,970 | $23,176 | $5,794 | $14,485 | $14,485 |
| $700,000 | $ 31,370 | $24,856 | $6,214 | $15,535 | $15,535 |

ගැනුම්කරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් සම්බන්ධ වන අවස්ථාවලදී අවම වශයෙන් එක් අයකු හෝ ඉහත කී පදිංචිය පිළිබඳ අවශ්‍යතාවය සපුරාලිය යුතුය. කෙසේ වුවද එකී ගැනුම්කරුම එම සම්පූර්ණ මාස 12 කාල සීමාව තුල නිවසේ පදිංචිව සිටීම අත්‍යවශ්‍ය නොවේ.

ඉහත අවශ්‍යතා සපුරාලිය නොහැක්කේ නම් මුද්දර ගාස්තු සඳහා වන තක්සේරුව සාමාන්‍ය සම්මත අගයන් මත සිදු කෙරෙනු ඇත.

කෙසේ වුවද පදිංචිය පිළිබඳ අවශ්‍ය සුදුසුකම් තීරණය කිරීමේ පරමාධිකාරි බලය රාජ්‍ය ආදායම් කොමසාරිස් වරයා (The Commissoner of State Revenue) සතු වන අතර ඒ පිළිබඳ යම් වෙනසක් කිරීමට සාධාරණ හේතු ඇතැයි සලකන තාක් දුරට එවැනි වෙනසක් සඳහා ඉඩකඩ ලැබීමේ අවස්ථාවද පවතී.



එමෙන්ම යම් ඉඩමක් මූලික පදිංචි ස්ථානය ලෙස භාවිතා කළ හැකි යයි සැලකීමට නම් එකී ඉඩමේ ගොඩනැගිල්ලක් තිබිය යුතු වන අතරම කොමසාරිස් වරයාගේ අදහස පරිදි එකී ගොඩනැගිල්ල පුද්ගල පදිංචිය සඳහා නීත්‍යානුකූලව යෝග්‍ය ලෙස සැලසුම් සකස් කර ඉදිකිරීම් සිදුකර තිබිය යුතු වේ.

ඔබ මූලික පදිංචි ස්ථානය සඳහා වන සහනාධාරය දැනටමත් ලබා ඇත්නම් එකී පදිංචිය පිළිබඳ අවශ්‍යතාවය සම්පූර්ණ වීමට බාධාවන ආකාරයේ මොනයම් හෝ සිදුවීමක් වූ වහාම ඒ පිළිබඳ කොමසාරිස් වරයාට ලිඛිතව දැනුම් දීම අත්‍යවශ්‍ය වේ.

## සහනාධාරය සඳහා ඔබ අයදුම් කළ යුත්තේ කෙසේද?

2011 ජූලි 01 දින හෝ ඉන් පසුව සිදුවන පැවරුම්කර සඳහා රාජ්‍ය ආදායම් කාර්යාල මුද්දර බදු පත්‍රිකා 53 î (SRO Duties Form 53B) භාවිතා කළ යුතුය. මූලික පදිංචි ස්ථානය පිළිබඳ සහනාධාරය හා මූලික පදිංචි ස්ථානය මිලදී ගන්නන් සඳහා වන මුද්දර ගාස්තු ලිහිල් කිරීමේ ව්‍යවස්ථානුකූල ප්‍රකාශය.

මුල් පදිංචි ස්ථානය මිලදී ගන්නන් සඳහා වන මුද්දර ගාස්තු ලිහිල් කිරීමේ සහනාධාරය හෝ විශ්‍රාමිකයන් සඳහා වන වගකීමෙන් නිදහස් කිරීමේ සහනාධාරය (Pensioner Exemption) තෝරා ගැනීමට ඔබට ඇති අයිතිය.

ඔබ මුල් පදිංචි ස්ථානය මිලදී ගන්නන් සඳහා වන මුද්දර ගාස්තු ලිහිල් කිරීමට සුදුසුකම් ලාභී අයකු මෙන්ම විශ්‍රාමිකයන් සඳහා වන සහනාධාරයටද එකවර සදුසුකම් ලබන්නෙක්ද?

එසේ නම් ඔබ ඉහත කී විකල්පයන්ගෙන් එකක් පමණක් තෝරා ගැනීමට වගබලා ගත යුතුය. මන්ද එකී සහනාධාර දෙකම එක පුද්ගලයෙකුට ලබා ගැනීමට අවස්ථාවක් නොවන හෙයිනි.

ඒ සඳහා තෝරා ගැනීම ඔබ විසින් නොකරන්නේ නම් ස්වයංක්‍රීයවම ඔබව මුද්දර ගාස්තු ලිහිල් කිරීමේ විකල්පය කරා යොමු කරනු ඇත.

පෙර ක්‍රියාත්මක වූ ඩොලර් 13,000/- වූ මුල් පදිංචිය සඳහා වූ දීමනාව තවදුරටත් ක්‍රියාත්මක නොවන බවද ඔබ සිහි තබාගත යුතුය. කෙසේ වුවද ඩොලර් 7,000/- දක්වා වන දීමනාව :ත්‍යධඨ* ඔබ අදටත් හිමිකම් ලබන අතරම ඊට අප ඉහත විස්තර කළ 30% මුද්දර ගාස්තු අඩු කිරීමද අතිරේකව ඇතුලත්වන බවද සැලකිය යුතුය.

**මූලාශ්‍රය : රාජ්‍ය ආදායම් කාර්යාලය - වික්ටෝරියා**